The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page https://fssh.rjt.ac.lk/index.php/jahs-about/

# JAHS සඳහා ලිපි ඉදිරිපත් කිරීමේ සම්මතයන්

**විෂය ක්ෂේත්‍රය** - පුරාවිද්‍යාව, ඉතිහාසය, උරුම කළමනාකරණය, ස්මාරක හා පුරාකෘති සංරක්ෂණය, පුරාණ වාස්තුවිද්‍යාව, වාරි පුරාවිද්‍යාව, භූ පුරාවිද්‍යාව, පැරණි තාක්ෂණය, අභිලේඛන හා පුරා අක්ෂර විද්‍යාව, මානවවිද්‍යාව, මානවවංශ පුරාවිද්‍යාව, ජලාශ්‍රිත පුරාවිද්‍යාව, කෞතුකාගාර හා සංචාරක ක්ෂේත්‍රය ඇතුළු පුරාවිද්‍යාව හා උරුම අධ්‍යයන ආශ්‍රිත විෂයික ලිපි JAHS හි පළ කිරීමට නියමිත ය.

**භාෂාව:** සිංහල / English

**අකුරු මාදිළිය:** සිංහල - Iskoola Pota ඉංග්‍රීසි - Times New Roman

**අකුරු ප්‍රමාණය:** ප්‍රධාන මාතෘකා – 16 / Bold, අනු මාතෘකා – 14 / Bold, අන්තර්ගතය - 12

**ලිපියේ ප්‍රමාණය:** උපරිම වචන 12,000

## <u>පර්යේෂණ පත්‍රිකාව</u>

**මාතෘකාව** _____ පර්යේෂණයට අදාළවූත්, අනන්‍යවූත්, සංක්ෂිප්තවූත් එකක් විය යුතුය.

**කර්තෘ විස්තර** _ කතුවරයාගේ නම, ලිපියෙහි සඳහන් කළ යුතු තැපැල් ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය (email) හා දුරකථන අංකය යන විස්තර ඇතුළත් කළ යුතු වේ. කතුවරුන් කිහිප දෙනෙක් වේ නම් ලිපි ගණුදෙනු කරන කතුවරයාගේ (Corresponding Author) විස්තර විශේෂකොට (*) සඳහන් කළ යුතු ය. ලිපිය සමඟ Form No. 01 සම්පූර්ණ කර එවීම අනිවාර්ය වේ.

**සංක්ෂිප්තය** __ වචන 250-300 අතර ප්‍රමාණයේ පර්යේෂණ සංක්ෂිප්තයක් (abstract) විය යුතු අතර, එය අනුමාතෘකා නොමැති එක් පරිච්ඡේදයක් ලෙස සමන්විත විය යුතු වේ. එහි

1) මූලික හැඳින්වීම - පර්යේෂණ සන්දර්භයට ප්‍රවේශය, ගැටළුව හා අරමුණ

2) ක්‍රමවේදය - භාවිත කරන ලද ක්‍රමවේදය පිළිබඳ කෙටි හැඳින්වීමක්

3) ප්‍රතිඵල - හඳුනාගත් ප්‍රතිඵලවල සාරාංශයක්

4) සාකච්ඡාව - සාකච්ඡාවේ ප්‍රධානතම මතුකිරීම

5) සමාලෝචනය - සමස්තයේ සමාලෝචනය, නිගමන හා වෙනත් අර්ථකථන

ඇතුළත් කළ යුතු වේ. සංක්ෂිප්තය පර්යේෂණ පත්‍රිකාවේ විෂය මූලික නියෝජනයක් විය යුතු අතර පර්යේෂණ ලිපියේ නොමැති කිසිඳු කරුණක් එහි අන්තර්ගත නොවිය යුතුය.

**ප්‍රමුඛ පද** ______ පර්යේෂණ පත්‍රිකාවේ පිළිබිඹුවක් වන ප්‍රමුඛ පද 4 - 8 ත් අතර ප්‍රමාණයක් දැක්විය හැකි ය.

<u>ලිපිය සිංහලෙන් ඉදිරිපත් කරන්නේ නම් මාතෘකාව, කර්තෘ විස්තර, සංක්ෂිප්තය, ප්‍රමුඛ පද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.</u>

**හැඳින්වීම** _____ සංක්ෂිප්ත හරවත් පැහැදිලි කිරීමක් තුළින් ඔබේ පර්යේෂණයේ වැදගත්කම හා අවශ්‍යතාව හුවා දැක්විය යුතුය. මෙහි දී පර්යේෂණයේ අරමුණ, පරමාර්ථ, පර්යේෂණ ගැටළුව, උපන්‍යාස, සන්දර්භයට ගැලපෙන පරිදි විස්තර කළ යුතු වේ. ඔබ පර්යේෂණ ප්‍රතිඵල කිසිවක් මෙහි දී සඳහන් නොකරන අතර, මනා සාහිත්‍ය විමර්ශනයක් (මූලාශ්‍ර උපුටනයන් [References] සහිත) තුළින් ඔබේ පර්යේෂණයට හොඳ ප්‍රවේශයක් ලබා දෙන්න. ඔබේ පර්යේෂණය ක්ෂේත්‍ර විමර්ශනයක් නම්, ස්ථානීය විස්තරයක් සැපයීම ද සිදු කළ හැකි ය.

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page https://fssh.rjt.ac.lk/index.php/jahs-about/

**ක්‍රමවේදය** _____ දත්ත අත්පත්කර ගැනීම, විශ්ලේෂණය, සහ ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත් ක්‍රමවේද ප්‍රමාණාත්මකව දක්විය යුතු අතර, පර්යේෂණයේ තාක්ෂණික ගලායාම පාඨකයාට සන්නිවේදනය කරනුයේ මෙහිදී ය. අදාළ විෂයයපථය සම්බන්ධයෙන් අවබෝධයක් නොමැති අයෙකුට වුව ද තේරුම් ගත හැකි පරිදි මෙම ක්‍රමවේදය සකස් කළ යුතු වේ.

**ප්‍රතිඵල** _______ ඔබේ පර්යේෂණයට අදාළ ප්‍රතිඵල ඉදිරිපත් කරනුයේ මෙහි දී ය. ඒවා නිවැරදිව හා සංක්ෂිප්තව දක්විය යුතු වේ (මෙහි දී මූලාශ්‍ර උපුටනයන් [References] සහිත වෙනත් පර්යේෂණ ප්‍රතිඵල සාකච්ඡා කිරීමක් සිදු නොකරයි). ප්‍රතිඵල පෙළගැස්වීමේ රටාව පසු සාකච්ඡාවේ රටාව ද විය යුතුය.

**සාකච්ඡා** ______ ඔබේ පර්යේෂණයේ ප්‍රතිඵල විධිමත් සාකච්ඡාවකට බඳුන් කරන්නේ ද, ඒවායෙහි පර්යේෂණ අවශ්‍යතාව තහවුරු කරන්නේ ද මෙහි දී ය. මෙය ඉහත ප්‍රතිඵලවල පෙළගැස්මේ රටාව අනුගමනය කරන සාකච්ඡාවකි. ආරම්භයේ පෙන්වා දෙන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබගේ පර්යේෂණ ප්‍රතිඵල වෙනත් පර්යේෂණ සමග (මූලාශ්‍ර උපුටනයන් [References] සහිත) විග්‍රහ කිරීම මෙහි දී සිදු කළ යුතු ය. උපන්‍යාස සාධනය හෝ නිෂේධනය වීම සඳහා ඔබේ පර්යේෂණය ඉවහල් වූ ආකාරය විස්තර කළ යුතු ය. අවසානයේ දී අනාගත පර්යේෂණ අපේක්ෂාවන් සම්බන්ධයෙන් ද යම් ඉඟියක් ලබා දිය හැකි ය.

**සමාලෝචනය** _ පර්යේෂණ සාකච්ඡාවේ සමාලෝචනයක් මෙහි දී සිදු කරයි. සමාලෝචනය තුළ සාකච්ඡාවේ සඳහන් නොවූ කරුණු ඇතුළත් විය නොහැක. මෙම පර්යේෂණයේ අවශ්‍යතාව මෙන්ම ඒ සඳහා පර්යේෂණයෙන් සැළකිය යුතු දායකත්වයක් සිදු වූ බව හෝ පැවති රික්තකය පූර්ණය වූ බව හෝ එසේ නොවූ බව සඳහන් කරමින් සමාලෝචනය අවසන් කළ හැකි ය.

**උපකාරානුස්මෘතිය** _____ පර්යේෂණය සඳහා විවිධ අයුරින් සහයෝගය ලබා දුන් අය වෙනුවෙන් කෘතගුණ සැළකීමක් ලෙස ඔවුන්ගේ නාමයන් මෙහි සඳහන් කළ හැකි ය. පර්යේෂණයේ ආකෘතිය වැඩිදියුණු කිරීම සඳහා මගපෙන්වීම් කළ පුද්ගලයන් මෙන්ම මූල්‍යමය දායකත්වයන්, නිර්දේශයන් සැපයූ ආයතන හා නිළධාරීන් සම්බන්ධයෙන් ද මෙහි දී සඳහන් කළ හැකි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** හාවර්ඩ් උද්ධරණ ක්‍රමය (Latest Harvard Reference Style) භාවිත කළ යුතු වේ. උපුටාගැනීම් වන වගු, සැලසුම්, ඡායාරූප ශීර්ෂ සමඟ අදාළ මූලාශ්‍රය දක්වීම ද සිදු කළ යුතු ය.

**වගු, සැලසුම්, සිතියම් හා ඡායාරූප:** පර්යේෂණයට යොදාගන්නා වගු, සැලසුම්, සිතියම් හා ඡායාරූප ප්‍රධාන ලිපියෙන් පරිබාහිරව වෙන වෙනම හෝ Win.rar file format (minimum 1000 pixels width/height, or a resolution of 300 dpi or higher) ලෙස යොමු කළ යුතු වේ. සියළුම ඇමුණුම් TIFF/ JPEG ආකෘතියට අනුකූල විය යුතුය. ඇමුණුම් (වගු, සැලසුම්, සිතියම් හා ඡායාරූප) ලිපි අන්තර්ගතය තුළ අදාළ ස්ථානයේ දැක්විය යුතු අතර පිළිවෙළින් ඒවා අංක කළ යුතුය (ඡායාරූපය 01, වගුව 01, සැලසුම 01 ආදී ලෙස). වගු සඳහා ඇමිණුම් ශීර්ෂ වගුවට ඉහළින් විය යුතු අතර, සිතියම්, සැළසුම්, ඡායාරූප ශීර්ෂ ඒවාට පහළින් දක්විය යුතු වේ (අක්ෂර ප්‍රමාණය 8 pt ට නොඅඩු විය යුතුය). MS Word මඟින් වගු නිර්මාණය කළ යුතු අතර වර්ණ සැලසුම්, සිතියම් හා ඡායාරූප ඇතුළත් කළ හැකිය.

**ලිපිනය** ප්‍රධාන සංස්කාරක, පුරාවිද්‍යා හා උරුම අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය (JAHS),
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,
සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**විද්‍යුත් ලිපිනය** **jahs@ssh.rjt.ac.lk** (JAHS වෙත පර්යේෂණ පත්‍රිකා යොමු කිරීමේ දී හා සියලු ලිපි ගණුදෙණුවල දී මෙම විද්‍යුත් ලිපිනය භාවිත කරන්න)